සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | භූගෝල විද්‍යාව I පත්‍රය<br>புவியியல் வினாத்தாள்-I<br>Geography Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

<u>උපදෙස්</u>

- පළමු කොටසේ සියළුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වට වූ මුහුදු වන්නේ,
 (i) මධ්‍යධරණී මුහුද, රතු මුහුද (ii) කැස්පියන් මුහුද, එරල් මුහුද
 (iii) අරාබි මුහුද, චීන මුහුද (iv) ජපන් මුහුද, කළු මුහුද

02. උතුරු යුරෝපා හා උතුරු ආසියා ප්‍රදේශවල ව්‍යාප්තව පවතින දේශගුණ වර්ගය වන්නේ,
 (i) තුන්ද්‍රා දේශගුණය (ii) මධ්‍යධරණී දේශගුණය
 (iii) නිවර්තන දේශගුණය (iv) වියළි දේශගුණය

03. කෘෂිකාර්මික රටක ලක්ෂණයක් නොවන්නේ,
 (i) වෙළඳපොළ පුළුල්ය. (ii) අධ්‍යාපනය පහළ අගයක් ගනී.
 (iii) වෙළඳපොළ සීමාසහිතය. (iv) ප්‍රාග්ධන සම්පත් හිඟය.

04. ශ්‍රී ලංකාවේ කාර්මික නිමවුම් (කර්මාන්ත) සංයුතිය අනුව වැඩි දායකත්වයක් සපයනු ලබන්නේ,
 (i) ආහාරපාන වර්ග හා දුම්කොළ නිෂ්පාදනය
 (ii) සකස් කළ ලෝහ හා අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන
 (iii) රසායනික ද්‍රව්‍ය රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනය
 (iv) ඇඟලුම් හා ආහාර

05. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වයඹ දිග වෙරළේ පුත්තලමේ සිට මුලතිව් දක්වා ප්‍රදේශය හා යාපන අර්ධද්වීපයේ දක්නට ලැබෙන ප්‍රධාන පාංශු වර්ගය,
 (i) දියලු පස (ii) රතු දුඹුරු පස
 (iii) රතු කහ ලැටසෝල් පස (iv) රතු දුඹුරු ලැටසෝල් පස

06. මයිකා නිධි ව්‍යාප්ත ප්‍රදේශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
 (i) කහට ගහ, බෝගල, බෝතලේ
 (ii) කහට ගහ, පල්ලෙකැලේ, රා ගෙදර
 (iii) තලාතුඔය, බදුල්ල, ගොඩකෙවෙල
 (iv) බෝගල, වඩුමාන, මයිලපිටිය

07. සිතියමක මුහුනත තොරතුරක් පමණක් ඇතුලත් පිළිතුර කුමක්ද?
 (i) පරිමානය (ii) දිගාව
 (iii) සූචකය (iv) රජයේ ගොඩනැගිලි

08. සංවර්ධනය මැනීම සඳහා යොදාගත් මුල් කාලීන මිනුමක් වන්නේ,
 (i) ඒක පුද්ගල ආදායම (ii) සාක්ෂරතාව
 (iii) සෞඛ්‍ය පහසුකම් (iv) මාතෘ මරණ අනුපාතය

09. කිරිපට්ටි පාලනය පමණක් සිදු කරන රටවල් කාණ්ඩය ඇතුලත් පිළිතුර කුමක්ද?

(i) ඉංදියාව, ශ්‍රී ලංකාව, චීනය (ii) චීනය, ශ්‍රී ලංකාව, මැලේසියාව

(iii) ආර්ජන්ටිනාව, චීනය, ඉන්දුනිසියාව (iv) ඩෙන්මාර්කය,නවසීලන්තය,මෙක්සිකෝව

10. ශ්‍රී ලංකාවේ 1:50000 සිතියම් සඳහා පදනම් කරගත් ජාල රටාවට අනුව අංක 01 සිතියම ඇතුළත් පිළිතුර වන්නේ,

(i) පේදුරු තුඩුව (ii) මනිපේ (මනිපායි)

(iii) මාතර (iv) තංගල්ල

- **අංක 11 සිට 18 දක්වා එක් එක් ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

11. අකුණුසැර වර්ග හතරකට බෙදිය හැකිය. (නි, වැ)
12. ලැව් ගිනි ඇතිවීමට ස්වාභාවික මෙන්ම මානුෂ ක්‍රියාකාරකම් ද හේතු වේ. (නි, වැ)
13. ජන සංඛ්‍යාව, විවිධ ජන වර්ග සහ විවිධ ආගම් නියෝජනය කලද ඒ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයෝය. (නි, වැ)
14. ෛජවන්ද්‍රය ද්‍රව්‍ය දීර්ඝ කාලයක් තිස්සේ දිරාපත් වීමෙන් හා පාෂාණ ජීර්ණය මගින් සැපයෙන ජීර්ණාවශේෂ මිශ්‍ර වීමෙන් පස නිර්මාණය වේ. (නි, වැ)
15. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් වෙළඳපොල පුළුල් නොවේ. (නි, වැ)
16. බෙංගාල බොක්ක අවට හා ඉංදියන් සාගර කලාපයේ ඇති වන්නා වූ සුළි කුණාටුවක් ලෙස බැගියෝ කුණාටුව හඳුනාගත හැකිය. (නි, වැ)
17. ශ්‍රී ලංකාවේ පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්ත සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස කෙඔලින් හා බෝල මැටි භාවිතා කරයි. (නි, වැ)
18. ශ්‍රී ලංකාවේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාමාර්ගයක් ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හැඳින්විය හැකිය. (නි, වැ)

- **අංක 19 සිට 20 දක්වා ප්‍රශ්නවල (අ) හා (ආ) තීරු ගලපා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

19. මහාද්වීප අනුව ලෝක ජන සංඛ්‍යාව නිවැරදිව දක්වා ඇත්තේ,

| අ | ආ |
|---|---|
| 1. ආසියාව | A 16% |
| 2. අප්‍රිකාව | B 8% |
| 3. යුරෝපය | C 60% |
| 4. උතුරු ඇමරිකාව | D 10% |
| | E 5% |

(i) ABCD (ii) CABD (iii) BCAE (iv) DABC

20. ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනය කරනු ලබන රටවල් හා අදාල නිෂ්පාදන මධ්‍යස්ථාන පහත දැක්වේ.


| අ | ආ |
|---|---|
| 1. චීනය | A යුරල් කලාපය |
| 2. ජපානය | B නැගෙනහිර කාර්මික කලාපය |
| 3. රුසියාව | C දකුණු මැංචූරියා කලාපය |
| 4. ඉංදියාව | D මිචිගන් ප්‍රදේශය |
| | E ඔසාකා |

(i) ABED (ii) DABC (iii) ACBD (iv) CEAB

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

21. පරිවර්ති ගෝලය පෘථුවි පෘෂ්ඨයේ සිට ...................................... ක් පමණ දක්වා ඉහළට විහිදේ.
22. කෘෂි තාක්ෂණ උයන ...................................... ප්‍රදේශයේ පිහිටා තිබේ.
23. ප්ලාස්ටික් නිෂ්පාදනය ...................................... රසායන කර්මාන්තය ගනයට වැටේ.
24. 1:50000 මෙට්‍රික් සිතියම්වල පරිමාණය දක්වන ක්‍රම ...................................... කි.
25. ශ්‍රී ලංකාවට සුනාමි ආපදාවක බිහිසුණු අත්දැකීම ...................................... වර්ෂයේ දෙසැම්බර් 26 වන දින අත්විඳීමට සිදුවිය.

- පහත සඳහන් ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුර තෝරා හිස්තැනේ ලියන්න.




26. රැටයිල් ව්‍යාප්තව ඇති ප්‍රදේශය දක්වා ඇති අක්ෂරය වන්නේ, (............)
27. කොළඹට පසුව වැඩිම ජන ඝණත්වයක් ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය වන්නේ, (............)
28. නායයාම් ආපදාව සිදුවන දිස්ත්‍රික්කය දක්වා ඇති අක්ෂරය වන්නේ, (............)
29. පොල් ත්‍රිකොණයට අයත් දිස්ත්‍රික්කයක් දක්වා ඇත්තේ, (............)
30. ශ්‍රී ලංකාවේ සුළි සුළං උපද්‍රවය ඇතිවන දිස්ත්‍රික්කය ඇතුලත් අක්ෂරය වන්නේ, (............)

- අංක 31 සිට 40 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

31. ආසියාවේ වී වගා කරන ප්‍රදේශයක් ලෙස ...................................... හඳුනාගත හැකිය.
(තායිලන්තය, මැඩගස්කරය, ඕස්ට්‍රේලියාව)
32. ලෝක ජන සංඛ්‍යාවෙන් ...................................... % ක් ආසියාවේ ජීවත් වෙයි.
(60, 16, 10)
33. සාර්ක් රටවල් අතරින් ඉහළ මානව සංවර්ධනයක් ඇති එකම රට ...................................... වෙයි.
(ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්ථානය)

34. අයිජැෆ්ජල්ලා ජෝකුල් යමහල ක්‍රි.ව. ...................................................... දී විධාරණය විය.
(2014, 2015, 2016)

35. වලාකුළු හා වලාකුළු අතර විසර්ජනය සිදුවී ...................................................... අකුණු ඇතිවේ.
(වායු අකුණු, වලා අකුණු, පෘතුවි අකුණු)

36. පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැගිමා සිසිල් වීමෙන් ...................................................... පාෂාණ නිර්මාණය වේ.
(ආග්නේය,අවසාදිත,විපරිත)

37. පෘථිවි තලයෙන් ...................................................... % ක්ම ජලයෙන් වැසි පවති.
(97, 79, 71.8)

38. ක්‍රි.ව. ...................................................... සිට ලෝක ජන සංඛ්‍යාව කෙටි කාලයක් තුළ ශීඝ්‍ර වර්ධනයක් සිදුවිය.
(1750 ට පෙර,,1750 පමණ, 2000 පසුව)

39. ලැව් ගිනි ඇතිවීමට බලපාන මානුෂික හේතුවක් ලෙස ...................................................... හැඳින්විය හැකිය.
(ගිනි තැබීම, අකුණු සැර වැදීම, දැඩි නියඟය)

40. ක්‍රි.ව. 2015 වන විට ශ්‍රී ලංකාවේ ජනගහන වේගය ...................................................... කි.
(0.8, 1.2, 1.9)

ලකුණු 1× 40 = 40

e-තක්සලාව The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | භූගෝල විද්‍යාව II පත්‍රය<br>புவியியல் வினாத்தாள்-II<br>Geography Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

- මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටස අනිවාර්ය වේ. එහි "අ" හා "ආ" කොටස් දෙකටම පිළිතුරු සැපයිය යුතුවේ.
- දෙවන කොටසින් කැමති ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

(1) (අ) සපයා ඇති 1:50000 වර්ණ සිතියම් කොටස අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I මෙම සිතියම මත ABC වලින් දක්වා ඇති ස්ථානවල දක්කට ලැබෙන ලක්ෂණ පහත සඳහන් ඒවා. අතුරෙන් තෝරා ලියන්න.

I A - බෑවුමකි / ගංගාවකි

II B - ඓතිහාසික ස්ථානය / පන්සලකි

III C - පාලමකි / දුම්රිය නැවතුම් පොළකි (ල. 03)

II සිතියම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(a) පාසල පෙන්නුම් කරන සලකුණ ඇඳ දක්වන්න.

(b) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන පරිපාලන මායිමක් ඇඳ නම් කරන්න.

(c) සිතියම් ගත ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන මාර්ගයට අයත් සංකේතය ඇඳ දක්වන්න. (ල. 03)

III සිතියම් ගත ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන භෝගය කුමක්ද? (ල. 01)

IV සිතියම් ගත ප්‍රදේශයේ දක්නට ලැබෙන භූ ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

V D අක්ෂරයෙන් දක්නට ලැබෙන්නේ කුමන සංස්කෘතික ලක්ෂණයක්ද? (ල. 01)

(ආ) I නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා කර පහත දැක්වෙන දෑ සපයා ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.

(1) අප්‍රිකානු භූ තැටිය
(2) එරල් මුහුද
(3) ඇන්ඩීස් කඳුවැටිය
(4) ගෝබි කාන්තාරය
(5) චීනය (ල. 05)

II නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා කර පහත දැක්වෙන දෑ සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

(1) මහ ඉලුප්පල්ලම වී පර්යේෂණ ආයතනය
(2) කැළණි ගඟ
(3) ධමනී මිනිරන් පිහිටි බෝගල පතල
(4) යාල වනෝද්‍යානය
(5) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ස්වාභාවික වරාය ත්‍රිකුණාමලය (ල. 05)

## II කොටස

(2) I ශිලා ගෝලය බෙදා දක්වන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)

II වායු ගෝලයේ සංයුතිය අනුව වැඩිම ප්‍රතිශතයක් අඩංගු වායු වර්ග 03 පිළිවෙලින් ලියන්න. (ල. 03)

III ජල චක්‍රය ඇඳ, නම් කර, එහි ක්‍රියාකාරීත්වය පහදන්න. (ල. 05)

(3) I ලෝකයේ විශාලතම මහාද්වීප දෙක නම් කරන්න. (ල. 02)

II ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න. (ල. 03)

III ඔබගේ ප්‍රදේශයේ දේශගුණය මානුෂ කටයුතු වලට බලපාන ආකාරය නිදසුන් 03 ක් දක්වමින් පහදන්න. (ල. 05)

(4) I ශ්‍රී ලංකාවේ ප්‍රධාන වන ජීවී රක්ෂිත දෙකක් නම් කරන්න. (ල. 02)


II වනාන්තර පද්ධති ගත් විට එහි උප පද්ධති රාශියකි. ඉන් තුනක් ලියන්න. (ල. 03)

III ශ්‍රී ලංකාවේ වනාන්තර හා වන ජීවී රක්ෂිතවල ඇති ප්‍රයෝජන දෙකක් ලියා විස්තර කරන්න. (ල. 05)

(5) පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I පහත ලෝක සිතියමේ A හා B අක්ෂරවලින් දක්වා ඇති යපස් කෙත් දෙක නම් කරන්න.(ල. 02)

II C,D,E අක්ෂරවලින් දක්වා ඇති ලෝහමය නොවන ඛනිජ සම්පතක් වන මිනිරන් දක්නට ලැබෙන ප්‍රදේශ තුන නම් කරන්න. (ල. 03)





III පාංශු නිර්මාණයට බලපාන ලද සාධක 03 ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

(6) I නිශ්පාදන කර්මාන්ත දෙකක් ලියන්න. (ල. 02)

II කර්මාන්ත ස්ථාන ගත වීමට බලපාන සාධක 03 ක් ලියන්න. (ල. 03)

III ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය ව්‍යාප්ත රටවල් දෙකක් ලියා ඉන් එකක නිශ්පාදන මධ්‍යස්ථාන ස්ථාන ගත වීමට බලපාන සාධක ලියන්න. (ල. 05)


(7) ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.





I A හා B වශයෙන් දක්වා ඇති ජන ඝනත්වය අඩුම හා වැඩිම දිස්ත්‍රික්ක නම් කරන්න. (ල. 02)

II වයස් කාණ්ඩය අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව බෙදී ගොස් ඇති ආකාර තුන ලියා දක්වන්න. (ල. 03)


III ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)




SCALE 1 : 50,000




The National e-learning Portal for The General Education


උ

- <u>මුස්ලිම් පාසල් සඳහා උපදෙස්</u>

  - දෙවන කොටසේ ප්‍රශ්න තෝරා ගැනීමේදී ප්‍රශ්න අංක 08 හා 09 ප්‍රශ්න ද පිළිතුරු ලිවීමට තෝරා ගන්න.
  - පිළිතුරු සැපයීමේදී I කොටස අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න 08 න් 04 කට පිළිතුරු සපයන්න.

(8) I ස්වාභාවික සම්පත් අතරින් ක්ෂය නොවන සම්පත් දෙකක් නම් කරන්න. (ල. 02)

II ස්වාභාවික සම්පත් අතරින් වැදගත් වන ඛනිජ සම්පත් කොටස් 03 කට වර්ග කල හැකිය. ඒවා ලියන්න. (ල. 03)


III ජලය දූෂණය වන ආකාර 03 ක් දක්වා ඉන් එක් කරුණක දූෂණය වලක්වා ගත හැකි ආකාරය විස්තර කරන්න. (ල. 05)

(9) I බල ශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා ශක්ති උත්පාදක දෙකක් නම් කරන්න. (ල. 02)

II බලශක්ති පරිහරණයේදී මතු වන ගැටළු 03 ක් ලියන්න. (ල. 03)

III බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කමේ ඇති වාසි 03 ක් දක්වා ඉන් එකක වැදගත්කම පහදන්න. (ල. 05)

The National e-learning Portal for The General Education




SCALE 1 : 50,000